**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සංරචක-I - 2023**

**-----------------------------------------------------------------**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක I 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 100 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 434,140 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2026 ජූනි දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.
මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් 01 ට අනුව රු. මිලියන 38ක ප්‍රදාන මුදල අදාළ වත්කම් කාණ්ඩය යටතේ දැක්වීමකින් තොරව යන්ත්‍රෝපකරණ සහ | මිලියන 38 | මෙම ප්‍රදානය යටතේ උපකරණ මිලදී ගැනීම සඳහා 2024/03/31 දක්වා කාලය දීර්ඝ කර ඇති බැවින් දේපළ උපකරණ තුළ පාසල් ප්‍රදාන ලෙස දක්වා ඇත. මීට අදාළ උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් අදාළ වත්කම් තොරතුරු අදාළ ආයතනය වෙත ලැබීමෙන් | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | උපකරණ යටතේ ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | | පසු 2024 ගිණුම ඉදිරිපත් කරන විට මෙය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. | |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 මාර්තු 23 දිනැති අංක 05/2021 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 03 ඡේදය. | පාසල් ලබා ඇති කාර්යසාධනය මත ක්‍රමවේදයකට අනුව දෙවන අදියර යටතේ ප්‍රදාන ලබාදීමට කටයුතු කරන බව පෙන්වා දී තිබුණි. 2021 වසරේ ද ප්‍රතිපාදනවලට අදාළ ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකළ ජාතික පාසල් සඳහා 2022 සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති බව අමාත්‍යාංශය විසින් විගණනයට දැනුම් දී තිබුණි. | වසරක් තුළ, ප්‍රදානය අනුමත කිරීමේ සිට ප්‍රදානය කරන්නා දක්වා සම්පූර්ණ ක්‍රියාවලියම වර්ෂය තුළ සැලසුම් කළ නියමිත කාල රාමුව තුළ පැනනගින නොවැළැක්විය හැකි හේතූන් මත සම්පූර්ණ කිරීමට නොහැකි විය. | චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක EST/7/EXAMS/05/1007-6 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය. | එම ලිපියේ උපදෙස්වලට පටහැනිව, දෛනික සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි පැවති වැඩමුළුවට සහභාගී වූ පළාත් 5ක සියලුම නිලධාරීන්ට සම්පත් දීමනා වශයෙන් රු. 823,000ක් ගෙවා තිබුණි. | තවද චක්‍රලේඛයට අනුව වැඩමුළුව, සැසිවාරය, සම්මන්ත්‍රණය වැනි තාක්ෂණික අර්ථ දැක්වීම නිර්වචනය කර හෝ වෙනස් කර දක්වා නොතිබූ අතර එක් සැසියක් සඳහා අවම හෝ උපරිම සහභාගිවන්නන් සඳහා සංඛ්‍යාවක් කැඳවීමට ප්‍රතිපාදන දක්වා නොමැත. | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුකූල විය යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2018 දරන මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ 9.3 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වන බවට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී එක් මෙහෙයුම් කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | ඉදිරියේදී මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 96 ඡේදය. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 96 වැනි ඡේදය අනුව අභ්‍යන්තර විගණනය අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කළ යුතු වුවද, කෙසේ වෙතත් | අභ්‍යන්තර විගණන සැලැස්මේ සඳහන් ක්‍රියා අට හරහා මෙම GEMP ව්‍යාපෘතිය ද විදේශීය ව්‍යාපෘති යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇත. 2023 | ව්‍යාපෘතියේ ඇගයුම් ලේඛනයේ සහ මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| අභ්‍යන්තර විගණන වාර්තා 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා නොතිබුණි. | විගණන සැලැස්මට අනුව GEMP ව්‍යාපෘතිය සඳහා 2023 මැයි 10 වන දින අතුරු විගණන වාර්තාවක් නිකුත් කර ඇත. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | | | | |
| (අ) | පාසල් ප්‍රදාන | 178 | 92 | පාසල් 86 ක වියදම්වලට අදාළ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි. මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කරන ලද පාසල් 92 කට අදාළව ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.මිලියන 65ක් වියදම් කර රු.මිලියන 26 ක් ඉතිරිව තිබුණි. | අරමුදල් මාරු කිරීමේ ප්‍රමාදය. | අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව ජාතික පාසල් ශාඛාව පාසල් රැසකට මුදල් ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් වියදම් කිරීමට කාලය දීර්ඝ කර ඇත. | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගැයීම සඳහා ලබා දී ඇති මුදල් පරිහරණයට අදාළ චක්‍රලේඛය හා වාර්තාවලට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියා කළ යුතු අතර වාර්තා නිසි පරිදි පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | පාසල් ප්‍රදාන | 270 | 19 | පාසල් 253ක් වෙත ලබා දී තිබුණු රු. මිලියන 267.75ට අදාළව මූල්‍ය ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දක්වාම වාර්තා කිරීමට පියවර ගෙන නොතිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රගතිය අනුව පාසල් 19කට ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1.6ක් | අරමුදල් මාරු කිරීමේ ප්‍රමාදය. | 2022 නිකුත් කරන ලද SBLEG චක්‍රලේඛය අනුව මෙය ලබා දී ඇත තවද 2023 වසර අවසානයේදී පවා ප්‍රමාද වීම හේතුවෙන් අරමුදල්වලින් සමහරක් පාසල් වෙත යවා ඇති අතර ශාඛාව විසින් ප්‍රගතිය | චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සිදු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | වැය කර රු. මිලියන 16.4 ක් ඉතිරි වී තිබුණි. | | ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් ඇත. | |
| (ඇ) | පාසල් ප්‍රදාන | 105 | 0 | 2022 දී ජාතික පාසල් 105ක් වෙත ලබා දීම සඳහා රු. මිලියන 52.5ක ප්‍රදාන ලබා දීම සම්පූර්ණ කිරීමේ දිනය 2023 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණද, වියදම්වලට අදාළ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දින දක්වාම අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදල් මාරු කිරීමේ ප්‍රමාදය. | 2023 වසර අවසානයේදී පවා ප්‍රමාද වීම නිසා අරමුදල්වලින් සමහරක් පාසල් වෙත යවා ශාඛාව ප්‍රගතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරයි. | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගැයීම සඳහා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියාකළ යුතු අතර ලබා දී ඇති මුදල් පරිහරණයට අදාළ වාර්තා පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | කතන්දර පොත් මුද්‍රණය | 6 | 0 | පාසල් සිසුන්ගේ චිත්තවේගීය කුසලතා වර්ධනය සඳහා කතන්දර පොත් මුද්‍රණයට අදාළ වැඩමුළු පැවැත්වීම සඳහා 2022 වසරේ පාසල් කටයුතු ශාඛාව විසින් රු. මිලියන 1.2ක් වැය කර තිබුණි. වසර 02ක් ගතවී තිබුණද 2024 මැයි 15 වන විට එම කුඩා කතා පොත් 06 නිර්මාණය කර මුද්‍රණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩසටහන් පැවැත්වීම සඳහා බොහෝ කාලයක් වැය කිරීම. | එය සකස් වෙමින් පවතී. | ඉලක්කය සපුරා ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති අරමුණු වලින් බාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ හැරුණු විට වෙනත් අරමුණු සඳහා විසර්ජන සබැඳි දර්ශක ක්‍රියාත්මක නොවන ශාඛා 12ක වැඩමුළු හා වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 81ක් වැය කර තිබුණි. | DLI හෝ IOI නොවන ශාඛා ද DLI සහ IOI සඳහා පෙර විමසුමේ සඳහන් කළ පරිදි දායක වන බැවින් එම අරමුදල් ලබාදීම සඳහා ලෝක බැංකුවෙන් කිසිදු විරෝධයක් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල් යෙදවිය යුතුය. |

**3.3 උපයෝජනය නොකරන සම්පත්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විසර්ජන සබැඳි දර්ශක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපාදනය කරන ලද රු. මිලියන 467න් රු. මිලියන 234ක් වැය කර තිබූ අතර රු. මිලියන 233ක මුදලක් වැය නොවී ඉතිරිව පැවතුණි. විසර්ජන සබැඳි දර්ශක නොවන දෑ සඳහා ප්‍රතිපාදිත රු. මිලියන 877න් රු. මිලියන 191ක් වැය කර තිබූ අතර රු. මිලියන 686ක මුදලක් වැය නොවී ඉතිරිව පැවතුණි. | 2023 සැප්තැම්බර් මාසයේදී පමණ NCOE හි අලුත්වැඩියා කිරීම සඳහා ඡන්ද අංකය වෙනස් කිරීමෙන් රු.මිලියන 200 ක් ලැබුණි. නමුත් එම ක්‍රියාවලිය හේතුවෙන් 2023 වසර අවසන් වන තුරුම එම කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ අතර 2024 වර්ෂයේදී සියලු කටයුතු ආරම්භ කරන ලදී. තවද 2023 අයවැයෙන් ගෙවීමට නියමිතව තිබූ මුදල අග්‍රිම ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් 2024 ආරම්භයේදී ගෙවා ඇත. | නියමිත කාලය තුළ අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රයෝජනයට ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |
| (ආ) | වැඩමුළු සඳහා රු. මිලියන 120 ක් වැය කර තිබූ අතර ඉන් සියයට 62 ක් හෙවත් රු. මිලියන 74 ක් පාසල් ප්‍රජාවගේ ධාරිතා සංවර්ධනය සඳහා වැය කර තිබුණි. ඒ අනුව පාසල් සිසුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැය කර තිබුණේ මුළු වියදමෙන් සියයට 6ක් වූ රු. මිලියන 7ක් පමණයි. | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිසුන් සඳහා පවත්වනු ලබන සමහර වැඩසටහන් මගින් වුවද, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වගකීම අමාත්‍යාංශයට පැවරේ. සෑම වැඩසටහනක්ම පාසේ ධාරිතා සංවර්ධන වැඩසටහන් වන අතර ඒ අනුව එම පුහුණුවීම් පළාත් නිළධාරීන්ට හෝ, ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් සඳහා වන බැවින් ඒවා හරහා ප්‍රතිලාභ සිසුන් වෙත ළඟා වේ. එබැවින්, සිසුන් සඳහා පුහුණු වැඩසටහන MOE විසින් නොපවත්වන බැවින් අපට නිගමනය කළ නොහැකි අතර ඒ අනුව ධාරිතාව ඉහළ සිට පහළට වර්ධනය වේ. | පාසල් සිසුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වන වියදම් වැඩි කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශ පරිශ්‍රයේ ශ්‍රවනාගාර සහ කමිටු රැස්වීම් ශාලා පහසුකම් තිබියදී බාහිර ආයතන පරිශ්‍රවල දේශන ශාලා භාවිත කරමින් දේශන පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 7.5ක් වැය කර තිබුණි. | පෙර විගණන විමසුමට අනුව, ශ්‍රවණාගාරය, කමිටු ශාලා සහ අනෙකුත් කමිටු කාමර නිසි ක්‍රියාකාරී තත්ත්වයකට ගෙන ඒම සඳහා ප්‍රතිසංස්කරණය කිරීමේ හැකියාව පිළිබඳ ප්‍රතිපත්ති හා සැලසුම් | සම්පත් තිබෙන පරිදි භාවිත කිරීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතුය. |

ශාඛාව විසින් දැනටමත් ඉල්ලා ඇති නමුත් එවැනි නවීකරණ කටයුතු ලෝක බැංකු අරමුදල් භාවිතා කර අමාත්‍යාංශයට සිදු කළ නොහැකි බව ලෝක බැංකුව ප්‍රකාශ කර ඇත.

## 3.4 පද්ධති හා පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධාරිතා සංවර්ධනය යටතේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා විසර්ජන සබැඳි දර්ශක 9න් එක් දර්ශකයක් සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 168 ක් වැය කර ඇති අතර මුළු පිරිවැයෙන් සියයට 48.5 ක් වූ රු. මිලියන 247 ක් සමාලෝචිත වර්ෂය තුළදී දරන ලදී. එය මේ දක්වා මෙම ව්‍යාපෘතියෙන් කාර්ය මණ්ඩල පුහුණුව සඳහා දරන ලද වියදමෙන් සියයට 147ක් වේ. | අධ්‍යාපන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන ශාඛාව පසුගිය වසරේ ධාරිතා සංවර්ධන වැඩසටහන, ප්‍රේරක පුහුණු වැඩසටහන සම්බන්ධයෙන් විශාල පසුබෑමක් ඇති අතර ඒ සියල්ල පවත්වා ඇත. තවද 4000 කට අධික විදුහල්පති සේවයේ නිලධාරීන් බඳවා ගන්නා ලද අතර ඔවුන්ගේ සේවා ව්‍යවස්ථාවට අනුව මාසයක කාලයක් පළාත් මට්ටමින් පුහුණු කරන ලදී. | ව්‍යාපෘතියේ සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ සැලැස්ම සකස් කර දැනටමත් විගණනයට යවා ඇත, සාමාන්‍යයෙන් ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට සැලැස්මක් සකස් කර ලෝක බැංකුවේ කිසිදු විරෝධයක් නොමැතිව අධ්‍යාපන ලේකම්ගෙන් අනුමැතිය ලබා ගන්නා අතර එය නියමිත වේලාවට විගණනයට යොමු කරන ලදී. විගණන නිලධාරීන් පැමිණීමේ දී එය ඔවුන්ට ද පෙන්වා දෙන ලදී. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |